WORKED

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,721 — 1959 අප්‍රේල් 9 වැනි බ්‍රහස්පතින්ද—9.4.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 997 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 997 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 997 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 999 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ දැන්වීම් ... ... | 1000 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1003 |
| " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1959 අංක 138**

අංකය : ඩී. 80/රෙක් ට්.

### 1950 අංක 34 දරණ නාවුක හමුදා ආඥාපනත

"කොමොඩෝර්" ජී. ආර්. එම්. ද මැල්, ඕ. බී. ඊ., ඒ. ඩී. සී., මහතා දිවයිනට පැමිණෙන තුරු 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට, රාජකීය ලංකා නාවුක හමුදාවේ අණදෙන නිලධාරියෙක් වන රාජනාදන් කදිර්ගාමර්, ඇම්. වී. ඕ. මහතා 1950 අංක 34 දරණ නාවුක හමුදා ආඥාපනතේ 8 (1) ඡේදය යටතේ නාවුක හමුදාවේ කපිතාන් වශයෙන් වැඩ බැලීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 1 දින,
කොළඹ 1.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 139**

1959 මාර්තු මස 2 වෙනි දින සිට නැවත නියමයක් කරන තුරු ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු මහතා (සී.සී.ඇස්.) කැලෑ සංරක්ෂක වශයෙන් පත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියමකර ඇත්තේ ය.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

තැ. පෙ. 500,
1959 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේ දීය.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 140**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඑ්ඒ. 46/48.

එන්. ක්‍රිස්නදාසන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 3 වැනි දින, බලපිටියේ දිස්ත්‍රික් උසාවියේ අංක. පී. 339 නඩුවේ තීන්දුව දීමට, බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑ්ඒ. 54/48.

එන්. එම්. ජේ. රාජේන්ද්‍රම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 29 වැනි දින, තංගල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක. 51 බෙදුම් නඩුවේ තීන්දුව දීමට, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑ්ඒ. 26/48.

ඒ. ඊ. බුල්ජන්ස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 9 වැනි දින, කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක. 30,550 නඩුවේ තීන්දුව දීමට, කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑ්ඒ. 54/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මැයි 25 වැනි හා 26 වැනි දිනයන් හි, තංගල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක. 1,721 අපරාධ නඩුව/ තංගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 14,863 නඩුව ඇසීමට, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑ්ඒ. 21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 3 වැනි දින, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,314 නඩුව ඇසීමට, ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

997—ජේ. ඇන්. බී 12942—3,675 (4/59)

අංකය : ජේඒ. 1/48.

ඒ. වෛත්‍යලිංගම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 8 වැනි දින, අනුරාධපුරයේ මහේස්ත්‍රාත් උසාවියේ අංක. 7,861, 14,274, 15,912, 11,049 හා 16,989 නඩුවල, හා පොලොන්නරුවේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 15,587 නඩුවේ තීන්දුව දීමට, අනුරාධපුරයේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අනුරාධපුරයේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 19/48.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 25 වැනි දින, ගාල්ලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක. 4,914 හා 4,569 නඩුවල තීන්දුව දීමට, ගාල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1959 මාර්තු 26 වැනි දින පටන් 30 වැනි දින දක්වා, බලපිටියේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1959 අප්‍රේල් 8 වැනි හා 15 වැනි දිනයන්හි, මහනුවර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1959 මාර්තු 30 වැනි දින, යාපනේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ, මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 62ඒ/57.

ජේ. එෆ්. ඒ. සෝස මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. එෆ්. බිලාසේ මහතා 1959 අප්‍රේල් 9 වැනි දින පටන් 16 වැනි දින දක්වා, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 71ඒ/51.

ඩී. විමලරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඕ. සල්ගාදු මහතා 1959 මාර්තු 30 වැනි දින, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1959 අප්‍රේල් 1 වැනි දින, කුරුණෑගල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඕ. එම්. එල්. පින්ටු මහතා 1959 අප්‍රේල් 3 වැනි දින, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා රත්නපුරේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : 5ඒ/55.

ඒ. ඊ. බුල්ජන්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩී. රත්නතුංග මහතා 1959 අප්‍රේල් 4 වැනි දින පටන් 17 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා තංගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හම්බන්තොට, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 8බී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1959 අප්‍රේල් 11 වැනි, 13 වැනි හා 15 වැනි දිනයන්හි, හලාවත, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1959 අප්‍රේල් 8 වැනි දින පටන් 20 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1959 අප්‍රේල් 6 වැනි දින, මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක. 4,273 නඩුව ඇසීමට, මාතලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ සේනානායක මහතා 1959 අප්‍රේල් 4 වැනි දින පටන් 14 වැනි දින දක්වා, හා පී. එස්. ඩබ්ලිව්. අබේවර්දන මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, අප්‍රේල් 15 වැනි දින පටන්, ඒ. සේනානායක මහතා ගම්පහ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 43/48.

එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1959 අප්‍රේල් 24 වැනි දින, මාතර මහේස්ත්‍රාත් උසාවියේ අංක 56,173 නඩුව ඇසීමට, මාතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

එස්. ජේ. බී. ධර්මකීර්ති මහතා 1959 අප්‍රේල් 1 වැනි දින, මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 4,732 නඩුව හා දඹුල්ලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 8,914 නඩුව ඇසීමට, මාතලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

ඊ. එස්. සාලි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එම්. ගුණරත්න මහතා 1959 අප්‍රේල් 17 වැනි දින පටන් 19 වැනි දින දක්වා, මීගමුවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එස්. 3/48.

එල්. සී. ජී. සිල්වා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සේරසිංහ මහතා 1959 මාර්තු 25 වැනි හා 26 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා හා මාගම් පත්තු, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 3/48.

එල්. සී. ජී. සිල්වා මහතා නැති අතර, ඊ. එස්. ඕල් මහතා 1959 මාර්තු 29 වැනි දින, තංගල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා හා මාගම් පත්තු, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ. 1/48.

ඊ. එල්. ජේ. හජී මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. පෙරේරා මහතා 1959 අප්‍රේල් 11 වැනි හා 13 වැනි දිනයන්හි, බදුලු දිස්ත්‍රික්කයේ, වෙල්ලස්ස-බින්තැන්න හා බුත්තල, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට හා යටිකිඳ, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ඒ. විජේකුලසූරිය මහතා 1959 අප්‍රේල් 15 වැනි දින පටන් 18 වැනි දින දක්වා හා 20 වැනි දින, ගාලු දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ හා හිනිදුම් පත්තුවේ, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැල්ලබඩ පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජේ. 1/48.

එම්. පී. ජේනු දීන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1959 අප්‍රේල් 16 වැනි හා 17 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය. පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1959 අප්‍රේල් 6 වැනි දින පටන් 9 වැනි දින දක්වා හා 15 වැනි දින පටන් 17 වැනි දින දක්වා, මඩකලපු දිස්ත්‍රික්කයේ, අක්කරෙයි හා පානම පත්තු, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 අප්‍රේල් 2 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඝාලය,
තැ. පෙ. අංකය 573, කොළඹ.

---

# වෙනත් පත් කිරීම්

**1959 අංක 141**

අංකය: ඒ.ජේ. 2/7/52.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

අංක 10,787 සහ 1955 අප්‍රේල් මස 22වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද ඊ. වේලායුතම් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් පත්කිරීම අවලංගු කර ඇත්තේ ය.

දිව්රුම් සම්බන්ධ ආඥපණතේ 12වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් 1959 අප්‍රේල් මස 3වෙනි දින සිට ආර්. ඇම්. ඒ. රත්නායක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයෙක් වශයෙන් පත්කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16වෙනි පරිච්ඡේදයේ 120වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 ජනවාරි මස 1වෙනි දින සිට තිරිකුණාමලේ දිස්ත්‍රික්කයේ කෝඩ්ඩියර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාළක නිලධාරී ධූරය දරණ කාලය තුළ එම පත්තුවේ අපරාධ පරීක්ෂක ධූරයට කේ. සෙල්වරත්නම් මහතාද,

1959 ජනවාරි මස 1වෙනි දින සිට තිරිකුණාමලේ දිස්ත්‍රික්කයේ තිරිකුණාමලේ නගර කොට්ඨාශයේ සහ කඩවත් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් පාළක නිලධාරී ධූරය දරණ කාලය තුළ එම කොට්ඨාවල අපරාධ පරීක්ෂක ධූරයට එස්. සුබ්‍රමනියම් මහතාද,

1959 ජනවාරි මස 1වෙනි දින සිට තිරිකුණාමලේ දිස්ත්‍රික්කයේ තම්පලකාමම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී ධූරය දරණ කාලය තුළ එම පත්තුවේ අපරාධ පරීක්ෂක ධූරයට වී. ආර්. නවරත්නරාජා මහතාද,

1959 ජනවාරි මස 5 වෙනි දින සිට තිරිකුණාමලේ දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී ධූරය දරණ කාලය තුළ එම පත්තුවේ අපරාධ පරීක්ෂක ධූරයට කේ. ගෝපාල රත්නම් මහතාද,

1959 මාර්තු මස 26වෙනි දින සිට ඊ. ගුණරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට එස්. ධම්බන්දු මහතාද,

1959 මාර්තු මස 26වෙනි දින සිට එක්ස්. එම්. සෙල්ලතම්බු මහතා නැවත වැඩ භාරගන්නා තුරු මඩකලපු දිස්ත්‍රික්කයේ ඉරවූර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාළක නිලධාරී ධූරයෙහි වැඩ බලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට ඒ. කන්දසියා මහතාද,

1959 මාර්තු මස 27වෙනි දින සිට පී. තිසේරා මහතා නැවත වැඩ භාරගන්නා තුරු මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට ඒ. සමරරත්න මහතාද,

1959 මාර්තු මස 29වෙනි දින සිට ඒ. සමරරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධූරයෙහි වැඩ බැලීමට පී. තිසේරා මහතාද,
පත්කර ඇත්තේ ය.

ජී. සී. පී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

**1959 අංක 142**

1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ, ගරු ස්වදේශ කටයුතු භාර ඇමති තුමා විසින්, තත්නියුතු හි පදිංචි මීරන්කන්ඩු හබ්බු මොහමඩ් මහතා, 1959 පෙබරවාරි මස 1 දින සිට 1959 ජූනි 30 වැනිදා වන තුරු, වව්නියා අධිකරණ කොට්ඨාශයේ ක්වාසි තනතුරට පත්කර ඇත්තේ ය.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 මාර්තු මස 26 දින
කොළඹ දීය.

---

**1959 අංක 143**

බබරුන්දගේ දෙන් අබේවර්ධන මහතා කොළඹ අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 මාර්තු මස 24 වැනි දින,
කොළඹ දීය.

---

**1959 අංක 144**

සංගරපිල්ලෙයි යෝගරාජා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹදීය.

---

**1959 අංක 145**

ඇන්ඩෘ තියෝෆිලස් ගුරුනාතර් බ්‍රිටෝ මහතා යාපනය අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දීය.

---

**1959 අංක 146**

බමුණුසිංහගේ දෙන් මර්වින් සමරසේකර මහතා නාරම්මල වාසස්ථානය සහ කායඝාලයද බිහල්පොල අතුරු කායඝාලයද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 මාර්තු මස 24 වෙන දින,
කොළඹ දීය.

# ආණ්ඩුවේ දැන්වීම්

## 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥාපනත

### නියෝගය

1947 සැප්තැම්බර් 24 වැනි දිනය හා 9,773 අංකය දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර, 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥා පනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, කෘෂිකම් හා ආහාර අමාත්‍ය නැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මෙම නියෝගය මගින්, 1958 අගෝස්තු 1 වැනි දිනය හා 11,465 අංකය දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණු නියෝග යෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද ප්‍රකාර, 1953 දෙසැම්බර් 11 වැනි දිනය හා 10,621 අංකය දරන ගැසට් පත්‍රයේ පළ කළ නියෝගය, ඊට යාකළ උප ලේඛනයේ 1 වැනි තීරයේ අගට පහත දක්වෙන කොටස ඇතුලත් කොට, සංශෝධනය කරමි:—

"රනවීර අබේරත්න"
"තිබ්බොටුවේ දෙන් ජිනසේන විතාරන"

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකම් හා ආහාර ඇමති.

1959 3. 30 වැනි දින,
කොළඹ.

---

## 1945 අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනත

1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ප්‍රකාශයෙන් වෙනස් කරනු ලැබූ පරිදි, 1945 අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනතෙහි 52 වෙනි වගන්තියෙන් අධිකරණ ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් සම්පාදිත ව්‍යවස්ථාව.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරන ඇමති.

1959 මාර්තු 30 වෙනි දින,
කොළඹ.

### ව්‍යවස්ථාව

1948 ඔක්තෝබර් 1 වෙනි දින අංක 9,909 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ගම්බද උසාවි සඳහා වූ සිවිල් නඩු විධාන ව්‍යවස්ථා, කලින් කලට සංශෝධනය කරන ලැබූ පරිදි, එහි 46 වෙනි ව්‍යවස්ථාව පහත සඳහන් අන්දමට තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1. ඒ ව්‍යවස්ථාවේ දෙවෙනි අතුරු විධානයෙහි (d) ඡේදයෙහි "වැටුප් හා ජීවන වියදම් දීමනාව" යන වචන වෙනුවට "වැටුප්, ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවනාධාර දීමනාව" යන වචන ආදේශ කිරීමෙන් හා;
2. ඒ අතුරු විධානයෙහි (d) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡේදයේ යෙදීමෙන්:—

   "(e) විනිශ්චිත ණයකරුට විරුද්ධ තීන්දු ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබූ සම්පූර්ණ ගණන හෝ එහි කොට සක් ගෙවීම සඳහා ඇපයක් වශයෙන් උකස් කරනු නො ලැබූද, ඒ තීන්දු ප්‍රකාශය ක්‍රියාවෙහි යොදවනු ලැබූ අවස්ථාවෙහි විනිශ්චිත ණයකරුගේ නියම වාසස්ථානය වූ ද, ඒ තීන්දු ප්‍රකාශය කරනු ලැබූ නඩුව පවරනු ලැබූ අවස්ථාවෙහි සිට එ වැනි වාසස් ථානය වූ ද, යම් ගෙයක්;"

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3වෙනි වගන්තියේ (1) හා (8)වෙනි උප වගන්තිවලින් හා 4වෙනි වගන්තියේ (1)වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය මානික්කු වඩුමේස්ත්‍රි හෙන්ද්‍රික් ද සිල්වා වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ ඔිතර පළාත ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි:—

(1) කටාන පදිංචි සෙම්බුකුට්ටි ආරච්චිගේ එඩ්වින් සිල්වා.
(2) දළුපොත පදිංචි අරුමපුරගේ ජෝන් ප්‍රැන්සිස් ප්‍රනාන්දු.
(3) කටාන පදිංචි අකුරුද්ද ලියනගේ දෙන් ඇල්බර්තු අප්පුහාමි.
(4) කටාන පදිංචි මහිපාල මුදලිගේ දෙන් හෙන්රි පීටර්.
(5) කඳවල පදිංචි විජේසිංහ මුදලිගේ දෙන් ඇල්බට් අප්පුහාමි.
(6) තිඹිරිගස්කොටුව පදිංචි හමුදු ජස්ටින් විල්ප්‍රඩ් ගුණසේකර.
(7) පැතිගොඩ පදිංචි වීරසූරිය කඩුමුට්ටුගේ පීටර් ප්‍රනාන්දු.
(8) බඩල්ගම පදිංචි වේදේහි පතිරන්නැහෙලාගේ තෝමස් අමරසේකර වික්‍රමසිංහ.
(9) ගොඩිගොමුව පදිංචි විජේසිංහ කලුආරච්චිගේ දෙන් මාෂල්.
(10) ඉහළ මඩම්පැල්ල පදිංචි විජේසුන්දර පතිරාජගේ සිරිසේන කරුණාතිලක.
(11) අකරගම පදිංචි රන්හොට්ටි පේඩිගේ සිරිසේන.
(12) ඔිතරවාඩිය පදිංචි සේරසිංහ ආරච්චිගේ දෙන් විල්ප්‍රඩ්.
(13) අම්බලයාය පදිංචි සේනාංග මුදලිගේ දෙන් ඇල්බර්තු අප්පුහාමි.
(14) කෝන්ගොඩමුල්ල පදිංචි කිරිපිටි ආරච්චිගේ දෙන් පාවුලු අප්පුහාමි.
(15) කටාන පදිංචි සෙම්බුකුට්ටි ආරච්චිගේ ඇල්බට් සිල්වා.
(16) කටාන පදිංචි පත්තාගේ පීටර් ජෝශප් ප්‍රනාන්දු.
(17) බම්බුකුලිය පදිංචි ඇන්තනි ප්‍රනාන්දු පාලප්පා.
(18) මුරුතාන පදිංචි වර්ණකුලසූරිය ජෙරෝනිමස් පෙරේරා.
(19) උදන්ගාව පදිංචි සන්තියාගෝ පීරිස් තෝමස් පුල්ලේ.
(20) ඇත්ගාල පදිංචි දෙමිනික් ජේරමියස් ප්‍රනාන්දු පුල්ලේ.
(21) වැලිහේන පදිංචි පේදුරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පුල්ලේ.
(22) කඳවල පදිංචි මුත්තා ස්ටැන්ලි අයිවන් ද සිල්වා.
(23) තිඹිරිගස්කොටුව පදිංචි හෙට්ටිආරච්චිගේ දෙන් ඩේවිඩ්.
(24) දළුපොත පදිංචි කනපතිපුල්ලේ සින්නප්පා සෙල්වදුරේ.
(25) ඒත්තුකාල පදිංචි ජෝශප් මාටින් මිරාල්.

(ආ) ඉහත කී මණ්ඩලයේ සභාපති වශයෙන් කටාන පදිංචි සෙම්බුකුට්ටි ආරච්චිගේ එඩ්වින් සිල්වා මහතා පත්කරමි. තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ අමාත්‍ය.

1959 අප්‍රේල් මස 6 දින, කොළඹ.

---

එල්. ඩී.—බී. 59/58.

## 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත

### 3 (2) වෙනි වගන්තිය යටතේ කරන ලද දැන්වීමයි

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති නැන්පත් මානික්කු වඩුමේස්ත්‍රි හෙන්දිරික් ද සිල්වා වන මම, මෙහි ඇති උප ලේඛනයේ සඳහන් එක් එක් ගම් ප්‍රදේශයක් සඳහා සමගිදායක සින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාවද, ඒ ගම් ප්‍රදේශයේ සෑම ග්‍රාම සංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජා මණ්ඩලයක්ද, සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියා පදිංචි කරනු ලැබූ ඒ ගම් ප්‍රදේශයේ සෑම සමුපකාර සමිතියක්ද, විසින්, නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි, ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1959, මැයි 2 වෙනි දින හෝ ඊට පළමු, මා වෙත නිර්දේශ කළ හැකි බව, මෙයින් දන්වමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ අමාත්‍ය.

1959, අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

### උපලේඛනය

(1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිලි හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි බෝයගනේ ගම් ප්‍රදේශය.

(2) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි නාරම්මල ගම් ප්‍රදේශය.

(3) හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි බෙලිඅත්ත ගම් ප්‍රදේශය.

(4) හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි වලස්මුල්ල ගම් ප්‍රදේශය.

(5) මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි මොරවක ගම් ප්‍රදේශය.

(6) මාතර දිස්ත්‍රික්කයේ කන්දබොඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශයේ පිහිටි කන්දපිට වලකඩ ගම් ප්‍රදේශය.

---

## 1953 අංක 36 දරණ රබර් නැවත වගාකිරීමට ආධාර දීමේ පණත

### නිවේදනයයි

1953 අංක 36 දරණ රබර් නැවත වගාකිරීමට ආධාර දීමේ පනතේ 10 වන ඡේදය යටතේ ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විසින් රබර් පර්යේෂණායතනයේ වැඩ බලන අධ්‍යක්ෂ සී. ඒ. ද සිල්වා මහතා, දැනට දිවයිනෙන් පිටත ගොස් සිටින රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක ආචාර්ය ඊ. ඩී. සී. බැප්ටිස්ට් මහතා වෙනුවට, රබර් වගා කිරීමේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් 1959 මාර්තු 29 වන දින සිට 1959 ජූලි මස 15 වන දින දක්වා පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. අල්වාපිල්ලේ,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම්.

1959.4.4 දා, කොළඹ දී ය.

---

රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් රාජපක්ෂ මුදියන්සෙලාගේ උපාලි රාජපක්ෂ මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහිර ලේකම්.

1959 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දීය.

---

## ජාතික වේතන ප්‍රතිපත්ති කොමිෂන් සභාව

### ජාතික වේතන ප්‍රතිපත්ති කොමිෂන් සභාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කර්තව්‍යයන් පවරා කොමිෂන් සභාවක් පත් කොට තිබේ :—

"(1) (අ) වෙළඳාම, ගනුදෙනු, ද්‍රව්‍ය නිෂ්පාදනය සහ කෘෂිකර්මය ද ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල, සහ

(ආ) වෙළඳ කාර්යයන් සඳහා හෝ වෙන අන් ලෙසකින් හෝ යම්කිසි ව්‍යාපාරයන් පවත්වා ගෙන යෑම පිණිස ග්‍රන්ථාරූඪ යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවා ඇති සංස්ථාවෝ

යන මේවායෙහි දැනට පවත්නා වේතන හා වැටුප් සැකැසුම පරීක්ෂා කර බැලීම.

(2.) නොපමාව ජාතික ආර්ථිකත්වය සංවර්ධනය කිරීමෙහි ලා ඇති අවශ්‍යතාවය කෙරෙහි යොමු වූ සැලකිල්ලෙන් යුක්තව—

(අ) වෙළඳාම, ගනුදෙනු, ද්‍රව්‍ය නිෂ්පාදනය සහ කෘෂිකර්මය ද ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල, සහ

(ආ) වෙළඳ කාර්යයන් සඳහා හෝ වෙන අන් ලෙසකින් හෝ යම්කිසි ව්‍යාපාරයක් පවත්වා ගෙන යෑම පිණිස ග්‍රන්ථාරූඪ යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවා ඇති සංස්ථාවෝ

යන මේවායෙහි නියුක්ත සේවකයන් පිළිබඳව, එම වේතන උපයන්නන්ට මෙන් ම ඔවුන්ගේ සේව්‍ය පක්ෂයටත් සම සාධාරණ ලෙස ලාභ ප්‍රයෝජන ලැබීම ඉෂ්ට වන අන්දමින් සකස් වූ ජාතික වේතන ප්‍රතිපත්තියක් නිර්දේශ කිරීම, සහ

(3.) නිවාඩු, ජීවනාධාර දීමනා, ගෙවල් කුලී දීමනා වැනි සහබද්ධ ප්‍රශ්නයන් පිළිබඳව යම් යම් වෙනස් කම් ඇති කළ යුතු යයි හැඟේ නම් ජාතික ආර්ථික සංවර්ධනය කාර්යයෙහි දී සේව්‍ය සේවක දෙපක්ෂය අතර උසස් ම සහයෝගය වැඩී යාමට ඉවහල් වන තත්ත්වයක් ඇති කරලීමේ අරමුණෙන් ඒ පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කිරීම."

2. පළමුකොට ම තමන්ට පැවරී ඇති කර්තව්‍යයන්ගේ සීමාවට ඇතුළත් වන වෘත්තීය ක්ෂෙත්‍රයෙහි දැනට පවත්නා වේතන සහ වැටුප් සැකැස් ම සම්බන්ධයෙන් නිරවුල් අවබෝධයක් ලබා ගැනීමට කොමිෂන් සභාව අදහස් කරයි. ඒ පිළිබඳව යථා තත්ත්වය විදහා දක්වන හැකිතාක් පුළුල් දර්ශනයක් ලැබීම බලාපොරොත්තුව හෙයින් සේවකයන්ගේ හා සේව්‍යයන්ගේ වෘත්තීය සමිති, වාණිජ මණ්ඩල, සංස්ථාවන් හා වෙනත් සංවිධාන ද මහජනයා ද යට සඳහන් වෘත්තීය ක්ෂෙත්‍රයේ දැනට පවතින වේතන හා වැටුප් සැකැසුම විමර්ශනයට භාජන කරන විස්තරාත්මක හා විවේචනාත්මක සංදේශ ඊට ඉදිරිපත් කරන්නේ නම් ඒවා පිළිගැනීමට කොමිෂන් සභාව කැමැත්තෙන් සිටියි.

3. සියලු ම සංදේශ (හැකි නම් කොළයේ එක පැත්තේ ටයිප් කර) පිටපත් දෙකක් සහිතව 1959 මැයි 18 වන දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි :—

ලේකම්,
ජාතික වේතන ප්‍රතිපත්ති කොමිෂන් සභාව,
තැ. පෙ. නො. 392,
කොළඹ.

කොමිෂන් සභාවේ අණ පරිදි,
ඩබ්ලිව්. ඇම්. තිලකරත්න,
ලේකම්,
ජාතික වේතන ප්‍රතිපත්ති කොමිෂන් සභාව.

1959 අප්‍රියෙල් 4 වන දින,
තැ. පෙ. නො. 392,
කොළඹ දී ය.

---

## අම්බලන්ගොඩ හික්කඩුව ධීවර ආරාවුල

ඉහත සඳහන් ආරාවුල පිළිබඳ වී. ඇස්. ජයවික්‍රම මහතා පැවත් වූ ප්‍රසිද්ධ විභාගයේ රපෝර්තුව 1959 මැයි මස 4 වැනිදා පෙරවරු 10.30 ට හික්කඩුවේ තානායමේදී ඒ මහතා විසින් කියවනු ලබන බව, ආරාවුලට සහභාගිවූ පක්ෂ වෙත හා ඒ සම්බන්ධව උනන්දුවක් දක්වූ අනිත් අයවලුන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ෆී. ඊ. ඒ. ද ෆොන්සේකා,
ධීවර අධිකාරී.

59. 3. 31 වැනිදා
කොළඹ,
ධීවර අධිකාරියේ දීය.

---

## 1952 අංක 25 සහ 1956 අංක 30 දරණ ධීවර (සංශොධන) පනත්වලින් සංශොධිත, 1940 හේ අංක 24 දරණ ධීවර ආඥාපනතේ 18 ඒ (3) වගන්තිය යටතේ කරන නිවේදනයයි

1959 මාර්තු 26 වැනි දින අංක 11,709 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් හිසින් පලවූ නිවේදනයෙහි සඳහන් ධීවර ආරාවුල සම්බන්ධ ප්‍රසිද්ධ විභාගය ආරම්භ කරනු ලබන්නේ එහි නියම කර තිබූ ප්‍රකාර 1959 මැයි 30 වැනිදා පෙරවරු 9.30 ට නොව 1959 මැයි 30 වැනිදා පෙරවරු 10 ට බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රෝලන්ඩ් ද සොයිසා.

1959 අප්‍රේල් 6 වැනිදා.

## 4 බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම් කුමන කාරණ නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුණි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුලත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන.

1959 අප්‍රේල් 6 වැනි දින,
කොළඹදීය.

### උපලෙඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි නො. සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමඟ ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| O 1069—15.10.50 | .. | මුරුගන් සින්නයියා, හල්ග්‍රන්ඔය වත්ත, හල්ග්‍රන් ඔය | සෙල්ලායි නොහොත් සෙල්ලම්මා (භාය්‍යාව) |
| O 1200—8.10.50 | .. | මුරුගන් සුප්පයියා, මැද කොටස, ඩෙල්මාර් වත්ත, හල්ග්‍රන් ඔය | පොච්චු (භාය්‍යාව), ලෙච්චුමි (දුව), තෙයිගරාජා (පුතා) |
| O 1336—8.10.50 | .. | රාමයියාගේ වැන්දඹුවවූ වේලායුදම් සෙලම්බායි, මැද කොටස, ඩෙල්මාර් වත්ත, හල්ග්‍රන් ඔය | කදිරවේල් නොහොත් තන්ගසාමි (පුතා), පෙරුමාල් නොහොත් ෂන්මුගනාදන් (පුතා) |
| O 1532—18.2.51 | .. | කරුප්පන් පෙරියන්නන්, ඉහළ කොටස, රාගල වතුයාය, හල්ග්‍රන් ඔය | කරුප්පායි (භාය්‍යාව), පොන්නම්පලම් (පුතා), මාරියායි (දුව), වීරමලෙයි නොහොත් නඩරාජා (පුතා) |
| O 1750—28.1.51 | .. | සින්නතම්බි රාමසාමි, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | කාමාච්චි (භාය්‍යාව), කමළම් (දුව), සිවසුබ්‍රමානියම් (පුතා), සොක්කලිංගම් (පුතා), වඩිවේල් (පුතා), පංචවර්නම් (දුව) |
| O 1770—28.1.51 | .. | කන්දයියා මුත්තුසාමි, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | පූවායි (භාය්‍යාව), කලප්පායි (දුව), වෙන්ගඩාසලම් නොහොත් සාම්මාලා (පුතා) |
| O 1804—28.1.51 | .. | වෙනගඩාසලම් පෙරුමාල්, බ්ලෙයාර්ලෝමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | මාරියායි (භාය්‍යාව), ජෙයලෙච්චුමි නොහොත් වල්ලිඅම්මා (දුව), සෙල්වම් (දුව), සුන්දරාම්බාල් (දුව) |
| O 2334—5.3.51 | .. | පලනියන්ඩි රෙන්ගසාමි, ගෝඩන් වත්ත, උඩපුස්සැල්ලාව | මාරියායි (භාය්‍යාව), රෙන්ගම්මාල් (දුව) |
| O 2382—5.3.51 | .. | වේලන් රෙන්ගන්, ගෝඩන් වත්ත, උඩපුස්සැල්ලාව | අන්ජලෙයි (භාය්‍යාව), සිවනායි (දුව), වේලායි (දුව), ලෙච්චුමායි (දුව), තන්ගවේල් (පුතා), සෙල්ලායි (දුව) |
| O 2402—5.3.51 | .. | සුප්පයියා වේලායුදම්, ගෝඩන් වත්ත, උඩපුස්සැල්ලාව | පොච්චු (භාය්‍යාව), තෙයිවානෙයි (දුව), ජෙයලෙච්චිමී (දුව) |
| O 2505—11.3.51 | .. | තෙරුවන් රාක්කන්, රූපහැනොක් වත්ත, උඩපුස්සැල්ලාව | කරුප්පයියා නොහොත් කරුප්පන් (පුතා) |
| O 4011—3.7.51 | .. | සින්නසාමි නඩේසන්, දිගලගින්න බසාර්, දිගලගින්න | පාරුවදම් (භාය්‍යාව), තවමනි (දුව), නාගෙස්වරි (දුව), සරස්වති (දුව), ජෝතිමනි (දුව), ඉන්ද්‍රානි (දුව), අන්නවඩිවු (දුව), වානජා (දුව) |
| O 4111—30.5.51 | .. | වෙල්ලයන් කොච්චන්, මූල්ඔය වත්ත, හේවාහැට | කාලිඅම්මා (භාය්‍යාව), සින්නපිල්ලෙයි නොහොත් තෙයිවානෙයි (දුව), පොඩිසකාන්ති නොහොත් ගාන්ධි (පුතා) |
| O 4730—17.7.51 | .. | සෙවුගම්පෙරියන්නන් මුත්තයියා, මහකුඩාගල්ල වත්ත, හල්ග්‍රන්ඔය | නල්ලම්මා (භාය්‍යාව), සොක්කලිංගම් (පුතා), රාජම්බාල් (දුව), රාමචන්ද්‍රන් (පුතා), තවමනි (දුව) |
| O 44746—19.7.51 | .. | සින්නපන්චන් සින්නයියා, බ්ලෙයාර්ලොමන්ඩ් උඩපුස්සැල්ලාව | රාමනාදන් (පුතා) |
| O 5151—24.6.51 | .. | සීනි පනයන් අඩෙයික්කලම්, අලකොලමඩපතන, උඩපුස්සැල්ලාව | පොලින්ගිඅම්මාල් (භාය්‍යාව), සිගමනි (දුව), තියාගරාජා (පුතා), තිරුපති (පුතා), තිරුවාසගම් (පුතා) |
| O 5600—10.7.51 | .. | කුමාරන් ආරුමුගම්, ජෝන්ස්ලන්ඩ් වත්ත, හේවාහැට | කාලිඅම්මාල් (භාය්‍යාව), මාරියායි (දුව), වීරමකලි නොහොත් අන්නම්මා (දුව), මනෝමනී (දුව), පලනිවේළු (පුතා), මනිඅම්මා (දුව) |
| O 5851—17.6.51 | .. | සුප්පයන් සන්දනම්, අල්ලකොල්ල කොටස, ගෝනපිටිය වතුයාය, කඳපොල | තනපාකියම් (භාය්‍යාව), සතාසිවම් (පුතා), වල්ලිඅම්මා (දුව), ජයලෙච්චිඅම්මා (දුව) |
| O 5853—17.6.51 | .. | මුත්තුසාමි රාමසාමි, අල්ලකොල්ල කොටස, ගෝනපිටිය වතුයාය, කඳපොල | කුල්ලම්මාල් (භාය්‍යාව), රෙන්ගම්මා (දුව), පලනිඅම්මා (දුව), ක්‍රිෂ්නසාමි (පුතා), නාරායනසාමි (පුතා), ආරුමුගම් (පුතා), අයිඅම්මා (දුව), ගනේසන් (පුතා), ජෙයලෙච්චුමි (දුව) |
| O 5854—17.6.51 | .. | මුත්තුසාමි මුත්තු, අල්ලකොල්ල කොටස, ගෝනපිටිය වතුයාය, කඳපොල | පලනියායි (භාය්‍යාව), පෙරුමාල් (පුතා), දෙරෙයිසාමි (පුතා), සුබ්‍රමානියම් නොහොත් මුරුගයියා (පුතා), රාසමානික්කම් (පුතා), අන්නලෙච්චිමී (දුව), තෙයිවානිඅම්මා (දුව), රුක්මනී (දුව), රාසම්මා (දුව) |
| O 6071—10.7.51 | .. | සදයන් රාමයියා, ඉහළ කොටස, හෝප් වත්ත, හේවාහැට | පාකියම් (භාය්‍යාව), ක්‍රිෂ්නාවනි (දුව), ගුනනේවන් (පුතා), සරස්වති (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| O 6082—10.7.51 | .. | කදිරවේල් සුප්පයියා, මැද කොටස, හෝප් වත්ත, හේවාහැට | පූවායි (භාර්‍යාව), කාමාච්චි (දුව), වල්ලිඅම්මා (දුව) |
| O 6084—10.7.51 | .. | මුක්කන් සම්බන්, මැද කොටස, හෝප් වත්ත, හේවාහැට | සෙවනායි (භාර්‍යාව), මහරානි (දුව) |
| O 6134—20.7.51 | .. | මුරුගන් ගෝවින්දන්, ඉහළ කොටස, හෝප් වත්ත, හේවාහැට | කදිරායි (භාර්‍යාව) |
| O 6352—24.6.51 | .. | අඩෙයික්කන් සින්නසාමි, දියතිල්ල කොටස, ලිඩස්ඩේල් වත්ත, හල්ග්‍රන්ඔය | වෙල්ලයම්මා (භාර්‍යාව) |
| O 6598—17.6.51 | .. | නායගම් අරුලාන්දු, ගෝනපිටිය වතුයාය, කඳපොල ... | මරිඅම්මාල් (භාර්‍යාව), සන්දනම් (පුතා) |
| O 6662—17.6.51 | .. | මානික්කම් ෂන්මුගම්, ගෝනපිටිය වතුයාය, කඳපොල | නාගම්මාල් නොහොත් මීනාච්චි (දුව) |
| O 6721—17.6.51 | .. | පලනියන්ඩි මානික්කම්, ගෝනපිටිය වත්ත, කඳපොල | තෙයිවානෙයි (භාර්‍යාව), පලනියන්ඩි (පුතා), රත්න සවුන්දරි (දුව), පාකියලීලා (දුව), එම්මානුවෙල් ජෝන් (පුතා), මහෙස්වරි (දුව) |
| O 6724—17.6.51 | .. | කයිලාසම් සෙවනුගේ වැන්දඹුවවූ පාලායි, ගෝනපිටිය වතුයාය, කඳපොල | සෙල්වමනි නොහොත් පෙරිඅක්කාල් (දුව), පලනියන්ඩි (පුතා), ලෝගමනි නොහොත් පෙරමායි (දුව) |
| O 6903—27.12.50 | .. | කදිරවේල් රෙන්ගසාමි, ලිඩස්ඩේල් වත්ත, හල්ග්‍රන්ඔය | සිරන්ගායි (භාර්‍යාව), ගෝවින්දම්මාල් (දුව), රාසු නොහොත් රාසම්මාල් නොහොත් සින්නපුල්ලේ (දුව), සින්නයියා (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොළඹ දිස්ත්‍රික්කයේ 1958–59 වර්ෂයට ගවයින් හණ නිවරණ කිරීමේ වැඩ සටහන

1943 ඔක්තෝබර් මස 15 වෙනි දින පළවුන අංක 9,181 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලද ගවයින් හණ නිවරණ කිරීම පිළිබඳ නීති මාලාවේ 3 (3) වගන්තිය අනුව, කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ 1958–59 වර්ෂයට ගවයින් හණ නිවරණ කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැනගැනීම සඳහා මේ පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1959. 4. 3 වෙනි දින,
කොළඹ කච්චේරියේදීය.

### හාපිටිගම් කෝරළයේ ගවයින් හණ නිවරණ කිරීම—1958–59

| කොට්ඨාශ නොම්මරය | | වසම | | ස්ථානය | | දිනයන් |
|---|---|---|---|---|---|---|
| 2 | ... | ලෝලුවාගොඩ, තලහේන, ගොඩකලාන, කඳන්ගමුව, නුගදෙනිය, කහටපිටිය සහ බැද්දෙගෙදර | | අලුත්වත්ත නමැති ඉඩමේදී ... | ... | 26.4.59 සහ 23.8.59 |
| 3 | ... | නාල්ල, ගිරිඋල්ල, කිතලවලාන, දෙල්වල සහ මඩුගහවත්ත | | මරක්කයාහේන නමැති ඉඩමේදී | ... | 19.4.59 |
| | | | | දෙමටගහවත්ත නමැති ඉඩමේදී | ... | 6.9.59 |
| 4 | ... | කහඳව, මාලදෙනිය සහ ඇලපිලියාව ... | ... | වෙලබඩලන්ද නමැති ඉඩමේදී | ... | 3.5.59 |
| | | | | ඇලපිලියාව නමැති ඉඩමේදී | ... | 6.9.59 |
| 5/6 | ... | හේනෙගම, මිණිඔළුව, කන්ඩලම සහ දෙමටහැත්ත | ... | පින්නගොල්ලවත්ත නමැති ඉඩමේදී | ... | 30.7.59 |
| 7 | ... | හකුරුකුඹුර ... ... | ... | කොච්චිගෙවත්ත නමැති ඉඩමේදී | ... | 20.8.59 |
| 8 | ... | මුගුරුගම්පොළ ... ... | ... | මීරිස්වත්ත නමැති ඉඩමේදී ... | ... | 16.8.59 |
| 9 | ... | මීරිගම ... ... | ... | බෝමළුව නමැති ඉඩමේදී ... | ... | 21.8.59 |
| 10 | ... | වල්බෝතලේ ... ... | ... | වල්බෝතලේවත්ත නමැති ඉඩමේදී | ... | 12.7.59 |
| 11 | ... | මදුරුපිටිය, අටුපත්දෙනිය, කඩිගමුව, හපුගහගෙදර සහ හරන්කහව | | ආරලියවත්ත නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 23.8.59 |
| 12 | ... | පිරිස්යාල, කීනදෙනිය, බජ්ජන්ගොඩ, හීනදූරේ සහ කන්වපලිය | | හපුගහවත්ත නමැති ඉඩමේදී | ... | 19.4.59 සහ 16.8.59 |
| 13 | ... | මාකුර, තලගම, කැබෙල්ලවිට සහ බලතෝව | ... | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 16.8.59 |
| 14 | ... | බෝතලේ පහළගම සහ අඩුපෙ ... | ... | හොරගොල්ල නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 23.8.59 |
| 14A | ... | බෝතලේ ඉහළගම ... ... | ... | මීරිස්වත්ත නමැති ඉඩමේදී ... | ... | 14.6.59 |
| 15 | ... | තවලම්පිටිය, විල්වත්ත, පොත්තෙමුල්ල සහ මුගුරුගම්පොල හන්දුරුමුල්ල | | දවටගහවත්ත නමැති ඉඩමේදී | ... | 15.4.59 |
| | | | | බෝගහවත්ත නමැති ඉඩමේදී | ... | 2.8.59 |
| 15A | ... | නැලිගම ... ... | ... | මීගහවත්ත නමැති ඉඩමේදී ... | ... | 25.5.59 |
| 16 | ... | හලුගම, කිදිවල සහ ලින්දර ... | ... | ගොන්නගහලන්ද නමැති ඉඩමේදී | ... | 25.4.59 |
| | | | | මුත්තෙට්ටුවත්ත නමැති ඉඩමේදී | ... | 25.8.59 |
| 17 | ... | පොහොන්නරුව ... ... | ... | බෙලිගහවත්ත නමැති ඉඩමේදී | ... | 16.8.59 |
| 18 | ... | පල්මඩ සහ පොහොන්රුව හන්දුරුමුල්ල | ... | මිල්ලගහවත්ත නමැති ඉඩමේදී | ... | 7.6.59 |
| 19 | ... | පන්නල්පිටිය, පමුණුවත්ත, හේනෙපොල සහ හීදියවල | ... | දෙමටගහවත්ත නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 23.8.59 |
| 20 | ... | වේවැල්දෙනිය ඉහළගම, පලපිටිය, මිල්ලවල | ... | අඹගහවත්ත නමැති ඉඩමේදී | ... | 19.4.59 සහ 2.8.59 |
| 20A | ... | වේවැල්දෙනිය පහළගම ... | ... | කටුකන්ගහවත්ත නමැති ඉඩමේදී | ... | 18.4.59 සහ 9.8.59 |
| 21/22 | ... | මඩබාවිට, පනාවල, අරුත්ගොඩ, සියඹලාගොඩ, දන්ඕවිට, නැව්ගල සහ කැලෑපිටිගම | | වඩුවත්ත නමැති ඉඩමේදී ... | ... | 12.4.59 |
| | | | | මෙනේරිවත්ත නමැති ඉඩමේදී | ... | 2.8.59 |
| 23 | ... | කොටදෙනිය සහ වේරගොඩ ... | ... | දූම්මලදෙනිය නමැති ඉඩමේදී | ... | 29.8.59 |
| 24 | ... | මුරුතවල ... ... | ... | දෙමටඕවිට නමැති ඉඩමේදී ... | ... | 29.8.59 |
| 25 | ... | හාපිටිගම, මක්කනිගොඩ සහ බටලීය ... | ... | හපුගහවත්ත නමැති ඉඩමේදී | ... | 5.4.59 සහ 22.8.59 |
| 26/27 | ... | කල්එලිය, පල්ලෙවෙල, හිරුමලමුල්ල, කල්එලිය උඩවෙල සහ මීදෙල්ලකොටුව | | කම්මලේවත්ත නමැති ඉඩමේදී | ... | 5.4.59 සහ 23.8.59 |
| 28 | ... | මල්ලැහැම සහ බෝලාන ... | ... | දන්සැලේ වත්ත නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 23.8.59 |
| 28A | ... | කල්එලියවැල්ලවිලමුල්ල, කල්එලියවැබොඩමුල්ල සහ රද්දල්ගොඩ | | නානායම්ගොඩල්ල නමැති ඉඩමේදී | ... | 26.4.59 සහ 23.8.59 |

| කොට්ඨාශ නොම්මරය | වසම | ස්ථානය | දිනයන් |
|---|---|---|---|
| 29/30 | මිදෙල්ලවල, රන්දෙනිපල්ලෙවෙල, වල්බෝලාන සහ වේරගොඩ | කෙමත්කඩ වත්ත නමැති ඉඩමේදී | 17.5.59 |
| | | බතලවත්ත නමැති ඉඩමේදී | 10.8.59 |
| 31 | බොකලගම අම්බලන්වත්ත සහ බොකලගම දෙලහේන | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 26.4.59 සහ 23.8.59 |
| 31A | බොකලගම ඉහලගම සහ බොකලගම පැලපිටිගම | කරඳගහවත්ත නමැති ඉඩමේදී | 23.8.59 |
| 32 | කුකුල්නාපෙ සහ පැලපිටිගම | කහටගහවත්ත නමැති ඉඩමේදී | 17..5.59 සහ 30.8.59 |
| 33 | නංවාපොල සහ දැත්ගම | හුරිගහවත්ත නමැති ඉඩමේදී | 19.6.59 සහ 21.8.59 |
| 34 | මුද්දරගම, පාතගම, මාන්ගෙදර, හිරිකුළුව සහ ගණේමුල්ල | මුලාදෑනිතැනගේ කායඝාලය පිහිටි ඉඩමේදී | 15.8.59 |
| 35 | බාදුරාගොඩ සහ කැප්පිටිවලාන | බුළුගහවත්ත නමැති ඉඩමේදී | 17.5.59 සහ 23.8.59 |
| 36 | ගස්පෙ | කැටකාලගහවත්ත නමැති ඉඩමේදී | 3.5.59 |
| | | එකාම්බුවත්ත නමැති ඉඩමේදී | 30.8.59 |
| 37/38 | උඩුල්ල, හිදියවල, ඉඹුලන්වල සහ දහෙන්පහුව | මීගහවත්ත නමැති ඉඩමේදී | 16.8.59 |
| 39 | කොස්සැටදෙනිය | දූන්වත්ත නමැති ඉඩමේදී | 26.4.59 සහ 23.8.59 |
| 40 | අඹන, යාපලාන, ඉදිපරපෙ, හිරිවල, හිණාමුල්ල, ගනේගොඩ සහ සියඹලාගොඩ | මල්ලැහැම පිල්ලෑව නමැති ඉඩමේදී | 26.4.59 සහ 16.8.59 |
| 41 | පරණහල්පෙ | අන්නාසිවත්ත නමැති ඉඩමේදී | 15.8.59 |
| 42 | හල්පෙ | ප්‍රජාමණ්ඩල ශාලාව පිහිටි ඉඩමේදී | 16.8.59 |
| 43 | කිතුල්වල | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 16.8.59 |
| 44 | වත්තෙමුල්ල සහ කළුඅග්ගල පහලගම | හුංගන්වල ගොඩැල්ල නමැති ඉඩමේදී | 26.4.59 |
| | | ඔලියාකොටුව නමැති ඉඩමේදී | 23.8.59 |
| 45 | කුලීගෙදර සහ පිටියගෙදර | අංකෙලිපිටියවත්ත නමැති ඉඩමේදී | 18.7.59 |
| 46 | කලුඅග්ගල ඉහලගම, මඩිතියවල, කරව්ව | ගොන්නගහමුලවත්ත නමැති ඉඩමේදී | 17.5.59 |
| | | දවටගහවත්ත නමැති ඉඩමේදී | 23.8.59 |
| 47/48 | හහවත්ත, නාර්ණපිටිය සහ රස්සපාන | වතියාය කැලේ නමැති ඉඩමේදී | 26.4.59 සහ 16.8.59 |
| 49 | උල්ලලපොල | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 25.4.59 සහ 23.8.59 |
| 50 | බලගල්ල | පුස්වැල් අගාරේවත්ත නමැති ඉඩමේදී | 10.4.59 සහ 24.8.59 |
| 51 | කුඩගම්මන | සියඹලාගහවත්ත නමැති ඉඩමේදී | 14.5.59 සහ 20.8.59 |
| 52 | හෙට්ටිමුල්ල, යටිමීය, ලොළුව, කැලෑගෙදර සහ පොත්තෙගෙදර හල්ඹළුව | වෙලේවත්ත නමැති ඉඩමේදී | 23.4.59 සහ 23.8.59 |
| 53 | නාවාන | කහටගහවත්ත නමැති ඉඩමේදී | 26.4.59 සහ 23.8.59 |
| 53A | පරගොඩ, දියගම්පොල, දිවුල්දෙනිය, කරවිලකුඹුර සහ කරබොටුවාව | කන්දෙබොඩවත්ත නැමැති ඉඩමේදී | 3.5.59 |
| | | ඔබඩලන්ද නමැති ඉඩමේදී | 16.8.59 |
| 54 | කොටදෙනියාව, එරබද්ද, ගලිංඹුරේ, වැලිහිද | කෝන්ගහවත්ත නමැති ඉඩමේදී | 26.4.59 |
| | | ගලිංඹුරේ වත්ත නමැති ඉඩමේදී | 23.8.59 |
| 54A | පොල්වත්ත, පුපුලගම්මන සහ මානින්ගමුව | පේරවලකටුව නමැති ඉඩමේදී | 26.4.59 |
| | | වලව්වවත්ත නමැති ඉඩමේදී | 9.8.59 |

---

## පිස්සු බල්ලෝ

බදුළු දිස්ත්‍රික්කයේ දැනට බල්ලන්ගෙන් අන්තරා තිබෙන බැවින් පිස්සු බල්ලන් සම්බන්ධව ආඥපනතේ අංක 333 දරණ පරිච්ඡේදයේ අංක 11 දරණ වගන්තිය යටතේ 1959 මාර්තු මස 30 වෙනි දින සිට මාස හයකට එම පළාත බදුල්ල, බණ්ඩාරවෙල සහ හපුතලේ පලාත් ආණ්ඩු සභා සහ වැලිමඩ සහ පස්සර සුළු නගර සභාවලට අයත් ප්‍රදේශ හැර පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශයක් හැටියට ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින් බදුලු දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශයට යටත් ප්‍රදේශය තුළ නොබඳින ලද හෝ අල්ලා නොගෙන යන බල්ලෙක් අන් කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියොත් ඌ වහාම මරා දමන්ට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුළු දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා

වෂ් 1959ක්වූ මාර්තු මස 30 වෙනි දින,
බදුළු කච්චේරියේදීය.

## 1946 අංක 32 දරණ වාරිමාර්ග පනත

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති, ලයනල් බාංක්‍රාෆ්ට් අබයරත්න වන මම, 1946යේ අංක 32 දරණ වාරිමාර්ග පනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තියෙන් මට පැවරී ඇති බලය අනුව පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් යෝජනාව අනුමත කරන බව මෙයින් දැනුම් දෙමි.

ඇල්. බී අබයරත්න,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

1959 අප්‍රේල් මස 1 වන දින,
රත්නපුර කච්චේරියේදීය.

### උපලේඛනය

**යෝජනාව**

" රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ හපුගස්තැන්නේ පිහිටි සුළු වාරිකර්මාන්තයක්වූ උඩුමුල්ලේ යායේ අමුණ යටතේ වගා කළ හැකි කුඹුරුවල අයිතිකරුවන්ගේ මෙම රැස්වීම, 1946යේ අංක 32 දරණ වාරිමාර්ග පණතේ 5 වැනි කොටස යටතේ සකස් කරනු ලැබුවාවූ එකී වාරිකර්මාන්තය මෙයින් අනුමත කෙරේ."

## විශේෂ නිවේදනයයි

1959 අප්‍රියෙල් 14 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රියෙල් 17 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රියෙල් 13 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 26 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී